පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම :- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අග්‍රාමාත්‍ය අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.**

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் எண் 79

நிறுவனத்தின் பெயர் - கல்வி வெளியீட்டுத் திணைக்களத்தின்

பாராளுமன்றத்தின் அரச கணக்கு தொடர்பான செயற்குழுச் சபையினால் தாக்கல் செய்யப்பட்ட அறிக்கைகள் தொடர்பான 119(4) ஆம் இலக்க நிலையியற் கட்டளையின் கீழ் கௌரவ பிரதமர் கல்வி, உயர்க்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரின் அவதானிப்புகள் மற்றும் மேற்கொள்ளப்படும் நடவடிக்கைகளை பாராளுமன்றத்திற்கு முன்னிலைப்படுத்தல்

Parliamentary Series No 79

Name of the institution :- Ministry of Education, Higher Education and Vocational Education

Submission of observations of Hon. Prime Minister ,Minister of Education, Higher Education and Vocational Education and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ අංකය : 79

ආයතනයේ නම : අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

<u>පළමු කොටස :78.00</u>

| අනු අංකය | පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 79 වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩු පාඩු | ආයතනය විසින් අඩු පාඩු නිවැරදි කරගැනීම සඳහා ගනු ලැබූ පියවරයන්ට අදාළ වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 13 | සැලසුම් ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි | 2022 වර්ෂයේ වාර්ෂිකව සැලසුම් ගත පුහුණු අවස්ථා ක්‍රියාත්කමක කිරීමේ සැලැස්ම සඳහා රු. මි. 166 ක් වෙන් කර තිබූ නමුත් ප්‍රමාණවත් ප්‍රගතියක් වාර්තා නොවීම සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය<br><br>2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සමහරක ගෙවීම් 2022 වර්ෂයේ දී සිදු කිරීමට නොහැකි වීම නිසා බැරකම් වශයෙන් රු. මිලියන 54.7ක් 2023 වර්ෂයේ දී ගෙවීම් සිදු කර ඇත. ඒ අනුව 2022 වර්ෂයට අදාළව රු. මිලියන 119ක (72%ක) ප්‍රගතියක් ඇතැයි සැලකිය හැකිය.<br><br>සැලසුම් කර ඇති සමහර වැඩසටහන් පවත්වා නැති අතර පැවැත්වූ වැඩසටහන් කිහිපයකට ගෙවීම් සිදු කිරීමට ද නොහැකි වී ඇත.<br><br>a. මෙම වර්ෂය තුළ නිලධාරීන් 50ක් NSBM ආයතනයේ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා දීමට සැලසුම් කර තිබූ නමුත් තත්ව සහතික කිරීම හා ප්‍රතීතනය පිළිබඳ කමිටුව විසින් NSBM ආයතනයේ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීම නිසා එම වැඩසටහන සිදුකිරීමට නොහැකි වී ඇත.<br><br>b. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට බඳවාගත් නිලධාරීන් 135 ක් සඳහා සේවාරම්භක පුහුණු මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීයයේ දී පවත්වා ඇතත් ඒ සඳහා මෙතෙක් ගෙවීම් සිදු කර නැත.<br><br>c. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා Certificate course on research methodology සහ certificate course on data analysis පාඨමාලාවක් පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් පවත්වා ඇති අතර ඒ සඳහා වූ රු. මි. 1.83ක ගෙවීම් සිදු කරන ලද්දේ 2024 වර්ෂයේ දීය. |

| | | |
|---|---|---|
| | | d. තව ද, කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හැදෑරූ නිලධාරීන්ගේ පාඨමාලා කාලය කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් වසරකින් දීර්ඝ කරන ලද බැවින් එම නිලධාරීන් සඳහා පූර්වයෙන් ගෙවීම් සිදු නොකරන ලද අතර පාඨමාලාව අවසන් කළ නිලධාරීන්ට ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත පාඨමාලාව හදාරා ඇත.<br><br>e. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ MBA (HRM) උපාධි පාඨමාලාව සඳහා එම විශ්වවිද්‍යාලයේ නිවේදනය අනුව අයදුම්පත් යොමු කළ යුතුව තිබූ අතර ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් අයදුම් කර නැත. |

2025/08/12

නාලක කලුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය